www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයෙහි ප්‍රකෝටිපතියන් සීඝ්‍රයෙන් වැඩිවීම

## An explosion of billionaires in China

**ජෝන් චාන් විසිනි**
**2007 නොවැම්බර් 14**

මේ වසරේ චීන මහජන සමූහාණ්ඩුවේ සුපිරි පොහොසතුන්ගේ ලේඛනය එරට සමාජ අසමානතාවයෙහි මට්ටම් පිලිබඳ විශ්මය ජනක චිත්‍රයක් සපයයි. ජාත්‍යන්තර ජනමාධ්‍ය තවමත් චීනය " කොමියුනිස්ට්" ලෙස නම් කල ද වෙලඳපොලහේ බන්ධනවලින් මිදුනු ක්‍රියාකරනය විසින් භූගෝලීය ධනවාදයේ කේන්ද්‍රය වන එක්සත් ජනපදය හැරුනු විට ලොව අන් සැම රටකටම වඩා මේ වසරේ චීනයෙහි ප්‍රකෝටිපතියන් බිහි කර ඇත.

පසුගිය මස නිකුත් කරන ලද එක්සත් ජනපදයෙහි පල කෙරෙන ෆෝර්බ්ස් සඟරාවේ " චීනයෙහි පොහොසත්ම 40 දෙනා" පිලිබඳ ලේඛනය අනාවරනය කලේ මොවුන්ගේ මුලු වටිනාකම පසුගිය වසරේ එක්සත් ජනපද ඩොලර් බිලියන 38 සිට මේ වසරේ ඩොලර් බිලියන 120 දක්වා තෙගුනයකින් දැවැන්ත වැඩි වීමක් වූ බව ය. සඟරාවේ විස්තර සටහනින් ලෙන්නුම් කරන ලද පරිදි: "චීනයෙහි පොහොසත් ම 40 දෙනාගේ මුලු වටිනාකමට සාපේක්ෂව පොහොසත්ම ඇමරිකානුවන් 40 දෙනාගේ මුලුවටිනාකම ඩොලර් බිලියන් 628කි.කලකට පෙර දුප්පත් වුවද චීනය අද නම් ලොව පොහොසත්ම රටට එතරම් පසුපසින් නො සිටී."

ඊට දින කිහිපයකට පසුව නිකුත් කරන ලද තවත් වාර්ෂික ලේඛනයක් වන හුරුන් රිච් ලිස්ට් (හුරුන් පොහොසතුන්ගේ ලේඛනය) අන්වරනය වූයේ වර්තමානයෙහි චීනයෙහි ප්‍රකෝටිපතියන් 106 දෙනෙක් සිටින බවය. පසුගිය වසරේ චීනයෙහි ප්‍රකෝටිපතියන් 15 දෙනෙක් සිටි අතර 2002 වසරේ ප්‍රකෝටිපතියන් කිසිවෙක් නොසිටියේ ය. දැන් ඇමරිකාවට පසුපසින් දෙවැනි විශාලතම ප්‍රකෝටිපතියන් කන්ඩායම සිටින්නේ චීනයෙහි ය. ඇමරිකාවේ ප්‍රකෝටිපතියන් 410 දෙනෙක් සිටී. කලින් දෙවැනි ස්ථානයෙහි පසු වූ ජර්මනියෙහි සිටින්නේ ප්‍රකෝටිපතියන් 55 දෙනෙක් පමන ය. එයට සපේක්ෂව චීනයෙහි ප්‍රකෝටිපතියන් සංඛ්‍යාව දෙගුනයකට ආසන්න ය.

හුරුන් රිච් ලිස්ට් ප්‍රකාශයට පත්කරන්නේ බ්‍රිතාන්‍යයේ වරලත් ගනකාධිකාරයෙකු වන රූපට් හූග්වර්ෆ් විසිනි. ඔහු කලින් ෆෝර්බ්ස් සඟරාවෙහි සේවය කල අයෙකි. චීනයෙහි ඔහු හඳුන්වන්නේ හූ රුන් ලෙසිනි. චීනයෙහි ධනපති පන්තියේ වර්ධනය වන ධනය හා බලපෑම පිලිබඳව ඔහු අවධාරනය කලේ ය: "චීනය ඉතා සීඝ්‍රයෙන් සංවර්ධනය වන බව අපි සියලු දෙනාම දනිමු. නමුත් වේගය කෙතරම් ඉක්මන් ද යත් අපි සියලු දෙනාම ඉන් තිගැස්සී ඇත්තෙමු. එම වේගය එක්සත් ජනපදයෙහි හා යුරෝපයෙහි වේගයට බොහෝ සෙයින් වැඩි ය... චීනයෙහි ප්‍රකෝටිපතියන් 200 සිටිය හැක. සිදු වී ඇත්තේ මෙතෙක් අප ඔවුන් හඳුනා නොගැනීම යි - එහි බොහොමයක් දෙනා වත්කම් වාර්තා නොකරති."

හුරුන් රිච් ලිස්ට් චීනයෙහි ධනවත්ම පුද්ගලයන් 800 ඇතුලත් කලේ ය. ඔවුන් සතු වත්කම්වල සාමාන්‍යය ඩොලර් මිලියන 562කි.මෙය පසු ගිය වසරේ වත්කම මෙන් දෙගුනයකි. ඩොලර් බිලියන 459.3ක් වූ ඔවුන්ගේ මුලු ධනය 2006 වසරේ චීනයෙහිදල දේශීය නිෂ්පාදනයෙන් සියයට 16ක ප්‍රතිශතයකට සමාන විය. ටෝකියෝ කොටස් වෙලඳපොලට වඩා විශාල ප්‍රාග්ධනයක් ඇති හුදෙක් ම චීනයෙහි අහස උසට නගින ව්‍යාපාරවස්තු වෙලඳපොලෙහි සමපේක්ෂනය තුලින් සිය ධනය එක්රැස් කරගත් පුද්ගලයින් මේ ලේඛනයට ඇතුලු නොවී ය.

චීනයෙහි ධනවත්ම 800 දෙනාගෙන් තුනෙන් කොටසක් පාලක චීන කොමියුනිස්ට් පක්ෂයේ (සීසීපීයේ) සාමාජිකයෝ වෙති. 38 දෙනෙක් ජාතික මහජන සම්මේලනයට නියෝජිතයෝය. බ්‍රිතාන්‍යයේ පලකරන ගාඩියන් පුවත්පත ඔක්තෝබර් 15 වැනි දින සීසීපී තන්ත්‍රය "යෝධ රදල පෙලැන්තියක්" ලෙස හැඳින්වීය. චීන දේශපාලන නායකයින්ගේ පවුල් හා මහා ව්‍යාපාරිකයින් අතර අතර සමීප සබඳතාව එහි සටහන් කෙරුනි. "ජනාධිපති හූ ජින්ටාවෝගේ දියනිය අති විශාල අන්තර්ජාල සමාගමක් වන සීනා සමාගමෙහි හිටපු ප්‍රධානියා සමග විවාහ වී සිටී. අගමැතිගේ බෑනා වන වෙන්ජියා බාවෝ වාර්තාගත පරිදි රටෙහි වඩාත්ම සාර්ථක පාපන්දු කන්ඩායම භාරව කටයුතු කරයි. හිටපු අගමැති ලී පෙංගේ පුත්‍රයා චීනයෙහි විශාලතම බලශක්ති උත්පාදක සමාගම පාලනය කරන අතර ඩෙංසියාවෝපිංගේ නෑදෑයින් විශාලතම ප්ලෝයි කන්ඩායමෙහි සිය ආධිපත්‍යය පතුරුවා ඇතැයි විශ්වාස කෙරේ" යැයි එහි ප්‍රකාශ වුනි.

*ෆෝර්බ්ස්* හා *හුරුන්* ය සඟරා දෙකට ම අනුව චීනයෙහි පොහොසත්ම පුද්ගලයා 26 හැවිරිදි යැං හුයියාන් ය. ඇය දකුනේ ගුවාන්ඩොං පලාතෙහි පිහිටි රටේ විශාලතම දේපල සංවර්ධන සමාගම වන කන්ට්‍රි ගාඩ්න් හෝල්ඩිංස් සමාගමේ ප්‍රධානියා ය. ඇය ආසියාවෙහි පොහෙසත්ම කාන්තාව ද වන්නී ය. ඇයගේ වටිනාකම ඩොලර් බිලියන17.5ක් හෝ යුවාන් බිලියන 130ක් වන අතර ඇයට සිය පියාගෙන් පාලක කොටස් උරුමයෙන් අයිතිවුනි. මේ වසරේ මුල දී තවත් සමාගමක් හොංකොං කොටස් වෙලඳපොළෙහි පාවීමට ඉඩ හැරීමෙන් පසුව එහි කොටස්කරුවන් හතර දෙනෙක් ද චීනයෙහි ඉහල ම පෙළේ ප්‍රකෝටිපතියන් 60 දෙනා අතර වෙති. සමාගමේ වර්තමාන වටිනාකම ඩොලර් බිලියන27කි.

යැංගේ පියා වන යැං ගුවෝකියැංගේ වෘත්තාන්තය චීන ධනවාදයේ දූප්පත්ම අඩියේ සිට පොහොසත්ම අඩියට පත් වූ අයගේ එකැයි ජනමාධ්‍ය අගයයි. ජ්‍යෂ්ට යැං එලදෙනුන් බලාගනිමින් හැදුනු වැඩුනු අක්දම මෑතක දී ලන්ඩන්හි පල කරන *ටයිම්ස්* පුවත්පත විස්තර කලේ ය. සිය පියා සුදුවට ඇබ්බැහි වීම හේතු කොට ගෙන පවුල විනාශයට පත් වීමෙන් පසුව ඔහු තරුන වියෙහි දී කැනීම් වැඩබිම්වල සිමෙන්ති කලවම් කරන්නෙකු වසයෙන් සේවය කාල් ය. යැං, ප්‍රාදේශීය දේපල සමාගමක කැනීම් කන්ඩායමේ ප්‍රධානියා විය. "නිශ්චල දේපල වෙලඳපොල සැකයට භාජනය වන තත්වයක පසුවත්ම චීනයෙහි වෙලඳපොලට හැඩගැසුනු ආර්ථික ප්‍රතිසංස්කරන දිශානතියත් සමග ම 1990 ගනන්වල මුල් භාගයේ දී හවුල්කරුවන් ගනනාවක් සමග ආපදාවනට ලක් වූ දේපල හා මුඩු බිම් අත්පත් කර ගැනීම යැං මහතා ඇරඹීය."

එසේ වුව ද, යැංගේ ඔට්ටු ඇල්ලීම ඔහුට වාසිදායක විය. 1989 වසරෙහි දී ආන්ඩු විරෝධී විරෝධතා කෲර ලෙස මැඬලීමෙන් පසුව බීජිං පාලනය "වෙලඳපොල ප්‍රතිසංස්කරනය" වේගවත් කලේය. " සමහරුන්ට මුලින් ම පොහොසත් වීමට ඉඩ හරින්න" යන අපකීර්තිමත් ප්‍රකාශය කරමින් ඩෙංසියාවෝ පිං 1992 වසරෙහි දී දකුනු දිග චීනයෙහි සංචාරයක යෙදුනි. බීජිං පාලනය සමාජ කැලඹිලි මැඩ පවත්වන බවට ටියනන්මෙන් චතුරස්‍රයෙහි සමූලඝාතනයෙන් සහතිකය ලද විදේශ ප්‍රාග්ධනය උතුරා යෑමට විය. ප්‍රසිද්ධ කියමන පරිදි ඉතිරි කොටස ඉතිහාසයට අයත්වේ. "කන්ට්‍රි ගාඩ්න් සමාගමට දැන් ජාත්‍යන්තර ආයෝජක බැංකුකරුවන් වන මෝර්ගන් ස්ටැන්ලි හා යූබීඑස් සමාගම්වල ආධාරය ලැබේ. කන්ට්‍රි ගාඩ්න් සමාගම මේ වසරේ දී ඩොලර් මිලියන 500ක ලාභයක් ලබන බවට අනාවැකි පලකර ඇත"යි *ටයිම්ස්* පුවත්පත පැහැදිලි කලේ ය.

චීනයෙහි ප්‍රකෝටිපතියන් හදිසියේ ඉස්මතු වීම ඵලදායී ව්‍යවසායන්ගෙන් ලාභ ලබාගැනීමේ ප්‍රතිඵලයකට වඩා බොහෝ දුරට දේපලවල හා සමාගම්වල කොටස් පිලිබඳ උමතු සමපේක්ෂනයක නිමැවුමකි. ඉහලම තත්වයේ වැජඹෙන ප්‍රකෝටිපතියන් 10 දෙනාගෙන් 9 දෙනෙකුගේ සමාගම් ව්‍යාපාර පොලවල ලේඛනගත කොට ඇති අතර 6 දෙනෙක් නිශ්චල දේපල සංවර්ධනය කරන්නන් වේ. චීනයෙහි පොහොසත්ම අනිත් දෙවැනි ස්ථානයෙහි පසුවන අය නයින් ඩ්‍රැගන් පේපර් නමැති නිෂ්පාදන සංස්ථාවේ අයිතිකරු වන සැංයින් ය. වේගයෙන් ඉහල යන කොටස් මිල ගනන් හේතු කොට ගෙන ඇයගේ වටිනාකම ඩොලර් බිලියන 10 දක්වා තුන් ගුනයකින් වැඩි විය. පෞද්ගලික මින්ෂෙං බැංකිං කෝපරේෂන් හි කොටස්කරුවන් 9 දෙනෙක් ද පිං ඇන් ඉන්ෂුවරන්ස් සමාගමේ කොටස්කරුවන් 7 දෙනෙක් ද වෙස්ටර්න් මයිනිං සමාගමේ කොටස්කරුවන් 7 දෙනෙක් ද ප්‍රකෝටිපතියන් වූනි.

බීජිංහි ආයෝජක බැංකුකරුවකු වන ඇන්ඩෘ සැං *චයිනා ඩේලි* පුවත්පතට මෙසේ පැවසී යඃ " (පොහොසතුන්ගේ) ලේඛනය ආර්ථිකයෙහි බුබුලු පෙන්නුම් කරයි. පොහොසතුන් තම ධනය එක්රැස් කිරීමේ දී තාක්ෂනය හඳුනාගැනීමේ වෙලඳලකුන හා ජාත්‍යන්තර ජාල උපයෝගි කරගෙන නැති තරම් ය."

චීනයෙහි සුපිරි පොහොසතුන් බිහිකිරීමෙහි ලා ගෝල්ඩ්මන් සැක්ස්, එච්එස්බීසී මෙරිල් ලින්ච්, යූබීඑස් හා ක්‍රෙඩිට් සුයිස් වැනි භූගෝලීය මූල්‍යමය දැවැන්තයින් ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇත. නිදසුනක් වශයෙන් චීනයෙහි දේපල සංවර්ධනය කරන්නන් 8 දෙනෙකු වෙනුවෙන් පසු ගිය තෙවසර තුල මොගන් ස්ටැන්ලි සමාගම හොංකොං කොටස් වෙලඳපොලෙහි ඩොලර් බිලියන ගනන් රැස් කිරීමට සහාය විය. කන්ට්‍රි ගාඩ්න් සමාගමට අමතරව එම සමාගමේ ගනුදෙනු කරුවන් අතර ඩොලර් බිලියන 6.7ක වත්කමක් ඇති දැනට චීනයෙහි අංක 3 ප්‍රකෝටිපතියා ලෙස සැලකෙන සූ රෙංමාවෝ වැනි නිශ්චල දේපල බලවතුන් හා ඩොලර් බිලියන4.7ක වටිනාකමක් ඇති ඇජයිල් ප්‍රොපටීස් සමාගමේ ප්‍රධානියා වන චෙන් සුචෝලිං ද වෙති.

පීකිං විශ්වවිද්‍යාලයෙහි මුදල් පිලබඳ මහාචාර්යවරයෙකු වන මයිකල් පෙට්ටිස් *සිඩ්නි මෝර්නිං හෙරල්ඩ්* පුවත්පතට සිය අදහස් දක්වමින් මේ දිනවල චීන වෙලඳපොලෙහි "හොඳම සූදුව" විස්තර කලේ ය. "ලාභයට ඉඩම් ලබාගෙන බොහෝ ඉහල මිලකට අලෙවි කිරීමෙන් නිශ්චල දේපල ක්ෂේත්‍රයෙහි අධි-උද්ධමනකාරී ලාභ ලැබෙනු දක්නට ඇත. මේ අතර ඩොලරයක ඉපැයුමකට 40 හෝ 50 ගුනයක අගයක් එකතු කරන ව්‍යාපාර වස්තු වෙලඳපොලක් ද ඇත.

මේ අනුව බුබුලක් මතුපිට තවත් බුබුලක් ඇතැ"යි ඔහු කීය.

2007 වසර "චීනය වැඩිවිය පැමිනි වසර" ලෙස හුග්වර්ෆ් හුවා දැක්වීය. මෙය අදාල වන්නේ ජනගහනයෙන් ඉතා කුඩා කොටසකට පමනි. චීනයෙහි සුපිරි පොහොසතුන් සතු වත්කම් යුරෝපයෙහි, ජපානයෙහි හෝ එක්සත් ජනපදයෙහි සුපිරි පොහොසතුන් සතු වත්කම් හා සමාන වන අතර 2006 වසරෙහි චීනයෙහි ඒක පුද්ගල දල දේශීය නිෂ්පාදිතය යන්තමින් ඩොලර් 2000ක් වූවා පමනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ශ්‍රේනිගත කිරීම අනුව චීනයට අයත් වන්නේ 107 වැනි ස්ථානයයි. මෙය එක්සත් ජනපදයේ ඒක පුද්ගල දල දේශීය නිෂ්පාදිතය වන ඩොලර් 44,000කට අධික ප්‍රමානය හා සසඳන විට සියයට 5කටත් අඩු ප්‍රතිශතයකි.

චීනය තියුනු ලෙස ධ්‍රැවීකරනය වූ සමාජයකි. එක් අන්තයක දිලිඳු වූ කම්කරුවන් හා ගොවීන් මිලියන සිය ගනනකි. අන්ත් අන්තයෙහි, අතලොස්සක් ධනපති ප්‍රභූව ය. බොස්ටන් උපදේශ කන්ඩායමක අධ්‍යයනයකට අනුව, 2005 වසරේ දී චීනයෙහි දශලක්ෂපති නිවැසියන් සංඛ්‍යාව 25,000ක් වූ අතර එයට ලොව ශ්‍රේනිගත කිරීමෙන් හයවෙනි ස්ථානය අයත් විය. මේ නිවැසියන් සංඛ්‍යාව මුලු නිවැසියන් සංඛ්‍යාවෙන් සියයට 0.4ක ප්‍රතිශතයක් වූ නමුදු ජාතික ධනයේ සියයට 70ක් පාලනය කලේය.

පොහොසතුන් හා දුප්පතුන් අතර අති විශාල පරතරය පොහොසතුන් කෙරෙහි පුලුල්ව පැතිරුනු එදිරිවාදිකමක් අවුලුවයි. මෑතක දී චයිනා යූත් ඩේලි පුවත්පත අවුරුදු 45ට පහල වයසැති පුද්ගලයින් ඉලක්ක කරගනිමින් සමීක්ෂනයක යෙදුනි. ඊට අනුව, ධන කුවේරයන්ට "සමාජ වගකීමක්" නොමැති බව සියයට 81ක අධික ප්‍රතිශතයක් විශ්වාස කලේ ය. ඔවුන් තම ධනය "නීති විරෝධී ලෙස" උපයා ගත් බව සියයට 68ක් සිතීය. දුප්පතුන් කෙරෙහි පොහොසතුන් ට " සුහද හදවතක්" නොමැති යයි සියයට 67ක් කියාපෑහ.

ධනයෙහි මූලාශ්‍රය මතභේදයට තුඩු දෙන කරුනකි. මෑත වසරවල දී පොහොසතුන්ගේ ලේඛනයට අයත් පුද්ගලයින් ගනනාවක් වැරදිකරුවන් ලෙස නිගමනය කොට අපරාධකරුවන් බවට පත්ව ඇත. බොහෝ විට දූෂිත නිලධාරින් සමග එකතුව ක්‍රියා කරමින් පොදු ජන අරමුදලු සොරාගැනීම, වැඩ කරන ජනතාවගේ නිවෙස් බලෙන් අල්ලා ගැනීම හෝ රජය සතු ව්‍යවසායන් කොල්ලකෑම පිලිබඳව මොවුන්ට නඩු පැවරිනි. එසේ වුව ද, මේ නඩු යටින් තිබූ විශාල අර්බුදකාරී තත්වයක මතුපිටින් පෙනෙන සුලු කොටස පමනක් විය. කර්මාන්ත ශාලාවල ගල්අඟුරු ආකරවල හා දැඩි ලෙස වැඩෙහි යොදවන වැඩපලවල " නීත්‍යානුකූලව" කම්කරුවන් සූරාකෑම පුලුල් ලෙස පැතිර පවතින අතර බොහෝ විට කෲරතරද වේ.

ධනවතුන් සම්බන්ධයෙන් පොදු මහජන නොරිස්සුම පිලිබඳව හඬ නංවමින් බීජිංහි සිටින නිර්නාමික සමාජ විද්‍යාඥයෙක් හොංකොංවල පලකෙරෙන *ඒෂියා ටයිම්ස් ඔන් ලයින්* පුවත්පතට මෙසේ පැවසී යː "වඩා නරක අතට පෙරලෙන අපවිත්‍රතාව ට, බහුලව පැතිරෙන ව්‍යාජ භාන්ඩවලට හා මත්ද්‍රව්‍යවලට, ලමුන් සේවාවල යෙදවීමට හා වහල් වැඩට යෙදවීමට මොවුන් යටත් පිරිසෙයින් අර්ධ වශයෙන් හෝ වගකිව යුත්තන් සේ සැලකිය යුතු ය."

නැගී එන මහජන වෛරය පිලිබඳව සැලකිලිමත් වෙමින් සමාජයේ ඉහලම පන්තිය දෙස දෘෂ්ටිවාදාත්මකව, විශේෂයෙන්ම, මාක්ස්වාදී දෘෂ්ටි කෝනයකින් නොබලන ලෙස නිලධාරිහු හා විද්වත්තු ජනතාවගෙන් ඉල්ලා ඇත්තා හ. දශක ගනනාවක් පුරා සීසීපීය "සමාජවාදී" පක්ෂයක් යයි ව්‍යාජ ප්‍රකාශ කර ඇත. පෞද්ගලික ව්‍යවසායකයින් සිය මුදල් උපයා ගන්නා ලද්දේ "දහඩිය මහන්සියෙන්"නිසා "ප්‍රාග්ධනය සතු වීමේ පාපකර්මය" යන්නක් නොමැති බව නිලධාරි පෙලැන්තියට අයත් ජ්‍යොෂ්ටයෝ සාමාන්‍ය ජනතාවට දේශනා කරති.

පසුගිය මස පවත්වන ලද 17 වැනි සීසීපී සම්මේලනයෙහිදී ජනිධිපති හූ ජින්ටාඕ මෙසේ ප්‍රකාශ කලේ යː "යම් නිශ්චිත රටක තත්වයන් හා මාක්ස්වාදය අනුකලනය වෙමින් කාලානුරූපව වර්ධනය වෙමින් ජනතාවගේ ඉරනම හා බද්ධ වූ විටෙක පමනි එහි ශක්තිමත් ප්‍රානවත් බව නිර්මානාත්මක බව හා සිත් ඇදගැන්ම ප්‍රදර්ශනය කල හැක්කේ ය යන්න වසර 160කට ආසන්න කාලයකට පෙරාතුව පල කරන ලද කොමියුනිස්ට් ප්‍රකාශනයෙන් පසුව භාවිතයෙන් ඔප්පු කරනු ලැබ ඇත."

සීසීපීය තවමත් මාක්ස්වාදය අනුගමනය කරන්නේ ය යන ප්‍රකාශය හුදෙක් ම විකාර රූපී එකකි. ප්‍රථමයෙන් මාක්ස් හා එංගල්ස් විසින් පැහැදිලි කරන ලද මූලික සත්‍යය නැවත වරක් චීනයෙහි පූර්න ධනවාදී "භාවිතයන්ගෙන්" ප්‍රදර්ශනය වී ඇත. එනම්, ලාභ පද්ධතිය, බහුතරය දුප්පත්කමට හා දුෂ්කරතාවනට නතු කරන අතර ඉතා කුඩා පිරිසකට අති විශාල ධනයක් ජනිත කරයි. එසේ කරන අතරවාරයේ, කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි පැහැදිලි කරන ලද පරිදි එය එහි මිනීවල භාරන්නා වන ජාත්‍යන්තර කම්කරු පන්තිය ද නිර්මානය කර ඇත. චීනයෙහි මෙය නියෝජනය වන්නේ දශලක්ෂ සිය ගනනක් වූ නගරබද කම්කරුවන් තුලිනි. සීසීපීයේ පොලිස් රාජ්‍ය සංවිධානය මගින් ආරක්ෂා කරන ලද ඉස්මතුවී එන ධනවාදී ප්‍රභුව හා ඔවුන් අතර ගැටුමකට පෙලඹීම අනිවාර්ය වනු ඇත.

© www.wsws.org